# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර අධිපන්තිය (පරිපාලන නිලධාරී තනතුර) සඳහා වන උසස් කිරීමේ පරිපාටිය

**01. සම්බන්ධ වන ආයතන**

1.1. දෙපාර්තමේන්තුව: සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
යොමු අංකය : DSD/HO/EST/02/02/SOR/MN- 07/AO — දිනය : 2018.11.28

1.2. අමාත්‍යාංශය : ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
යොමු අංකය : MSE/ADM/15/70/VII — දිනය : 2019.04.24

1.3. කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුර අනුමත කිරීම
යොමු අංකය : DMS/1284/V IV — දිනය : 2016.09.15

1.4. ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය :
යොමු අංකය: EST-2/02/REC/0719 — දිනය : 2018.06.29

1.5 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය :
යොමු අංකය : NSCC/5/08/101/SR-II — දිනය : 2018.10.04

1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය :
යොමු අංකය : PSC/EST/03-01-38/08/2018 — දිනය : 2019.07.18

**02. පත් කිරීම් බලධරයා :** රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**03. සේවා ගණය පිළිබඳ විස්තර :**

3.1 සේවා ගණය : කළමනාකරණ සහකාර අධිපන්තිය

3.2 ශ්‍රේණිය : විශේෂ

3.3 පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය :
අනුමත තනතුරු සංඛ්‍යාවට සීමා වන පරිදි අභ්‍යන්තර බඳවා ගැනීමේ ක්‍රියාවලියක් මගින් බඳවා ගනු ලබන, ජ්‍යෙෂ්ඨ විධායක හා විධායක නිලධාරීන්ගේ කාර්යභාරයට පරිපූරක/සුසාධ්‍යකාරක/උපස්ථම්භක වන පරිදි එම නිලධාරීන්ගේ අධීක්ෂණයට යටත්ව තනතුරු විශේෂිත කොට පවරා දෙනු ලබන පරිපාලන /පිරිස් කළමනාකරණ සහ මූල්‍ය කළමනාකරණ කාර්යයන් පැවරෙන නිලධර ගණයකි.

3.4 කාර්යයන් පැවරීම : ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර, මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාව මත ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාව පදනම් කොටගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයෙකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

04. තනතුරෙහි / තනතුරුවල ස්වභාවය: ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත
(විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට යටත්විය යුතුවේ)

**05. වැටුප්**

5.1 වැටුප් කේත අංකය : MN-7-2016

5.2 වැටුප් පරිමාණය : 41580 – 11 x 755 - 18 x 1030 - රු.68,425

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර :

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු.) |
|---|---|---|
| විශේෂ | පියවර 02 | රු. 42,335.00 |

වැටුප් ගෙවීම රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 උපලේඛන II හි සඳහන් පරිදි විය යුතුය.

06. සේවා ගණයට අයත් තනතුර / තනතුරු

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :

| අනුමත තනතුරු නාම | තනතුරු අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| පරිපාලන නිලධාරී | විශේෂ | 01 | කළමනාකරණ සහකාර, ආශ්‍රිත හා කණිෂ්ඨ නිලධරයන්ගේ ආයතනික කටයුතු අධීක්ෂණය, ස්ථානගත කිරීම්, වැටුප් වර්ධක නිර්දේශ කිරීම, ස්ථාන මාරුකිරීම් සඳහා නිර්දේශ ලබා දීම සහ කාර්ය සාධනය අධීක්ෂණය කිරීම, වාහනවලට අදාළ සියළු කටයුතු අධීක්ෂණය හා ඉන්ධන සැපයීමට අදාළ කටයුතු, කාර්යාලයේ උපයෝගිතා බිල්පත් ගෙවීම් සම්බන්ධ කටයුතු, කාර්යාල පරිශ්‍රය ක්‍රමවත්ව පවත්වා ගැනීමට අදාළ කටයුතු අධීක්ෂණය, ආරක්ෂක විධිවිධාන, කාර්යාලයේ ගොඩනැගිලි, පොදු පහසුකම් හා උපකරණ භාවිතය පිළිබඳ කටයුතු අධීක්ෂණය, සුභ සාධන කටයුතු පරිපාලනය හා අධීක්ෂණය, නෛතික තැපෑලට අදාළ කටයුතු කාර්යක්ෂමව කළමනාකරණය කිරීම, විභාග කටයුතු සංවිධානය කිරීම සඳහා අධ්‍යක්ෂවරයාට සහාය වීම රැස්වීම්, සාකච්ඡා සම්මන්ත්‍රණ සංවිධානය කිරීම, අධ්‍යක්ෂ ජනරාල් හා ආයතන හා පරිපාලන අංශයේ අධ්‍යක්ෂවරුන් විසින් පවරනු ලබන වෙනත් රාජකාරි |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : 01

07. බඳවා ගැනීමේ ක්‍රමය : මෙම තනතුර දරන්නාට පමණක් පෞද්ගලික වනසේ අනුමත කර ඇති බැවින් බඳවා ගැනීමේ ක්‍රමය අදාළ නොවේ.

08. කාර්යක්ෂමතා කඩඉම් : අදාළ නොවේ

09. භාෂා ප්‍රවීණතාව :

| භාෂාව | ලබා ගත යුතු ප්‍රවීණතාව |
|---|---|
| රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැදුණු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පරිවාස කාලය තුළදී ලබා ගත යුතුය. |
| අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 1/2014 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ විධිවිධාන අනුව අදාළ මට්ටමේ ප්‍රවීණතාවය ලබා ගත යුතුය. |

10. ශ්‍රේණි උසස් කිරීම : අදාළ නොවේ

11. තනතුරු වලට පත් කිරීම : අදාළ නොවේ.

12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිර වන්නා වූ කොන්දේසි : අදාළ නොවේ.

13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපන වලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ : "සක්‍රිය සේවා කාලය" යනු වැටුප් රහිත නිවාඩු කාලයන් ඇතුළත් නොවන, එහෙත් අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තියක් ලෙස සක්‍රිය සේවා කාලයක් ලෙස සැළකිය යුතු යැයි විශේෂිතව සඳහන් කරනු ලැබ ඇති වැටුප් රහිත නිවාඩු කාලයන් ද ඇතුළත්, නිලධාරියෙකු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සිටි සේවා කාලය වේ.

14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය කිරීම : අදාළ නොවේ.

15. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පටිපාටික රීති වල දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධි විධාන අදාළ වේ.

16. මෙම උසස්වීම් පරිපාටියේ විධිවිධාන සළසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරණු ලැබේ.

17. අන්තර් කාලීන විධිවිධාන :

2017 අංක 02 දරණ දිවිනැගුම ( සංශෝධන) පනතින් සංශෝධිත 2013 අංක 01 දරණ දිවිනැගුම පනතේ 44 (ඉ) iii වගන්තිය අනුව මනාපය පළකරන ලද නිලධාරීන් බඳවා ගැනීම සඳහා පමණි.

2017 අංක 02 දරණ දිවිනැගුම ( සංශෝධන) පනතින් සංශෝධිත 2013 අංක 01 දරණ දිවිනැගුම පනත අනුව ඒකාබද්ධ කරන ලද ආයතන වල 2014.01.02 දිනට කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 මගින් ලබා දී ඇති JM-1-1 වැටුප් පරිමාණය යටතේ සේවයේ නියුක්තව සිටි එම පනතෙහි 44 (ඉ) iii වගන්තිය අනුව නවක නිලධාරියකු ලෙස දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ සේවයට එක්වීමට මනාපය පළ කරනු ලැබ ඇති පරිපාලන නිලධාරියා, පහත සඳහන් කොන්දේසි වලට යටත්ව 2014.01.03 දින සිට වන පරිදි නවක නිලධාරියකු ලෙස සේවයට බඳවාගනු ලැබේ.

I. 2014.01.03 දිනට උපරිම වයස අවු.50ට නොවැඩි විය යුතුය. (අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 16/0243/711/001-1 සඳහා 2016 නොවැම්බර් 01 වන දින අමාත්‍ය මණ්ඩලය විසින් ලබාදුන් තීරණය අනුව)

*සටහන*

පනතෙහි 44 (ඉ) iii වගන්තිය අනුව නවක නිලධාරියකු ලෙස දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ සේවයට එක්වීමට මනාපය පළ කරනු ලැබ ඇති වයස අවුරුදු 50 ට වැඩි නිලධාරීන් සම්බන්ධව අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 16/0243/711/001-1 සඳහා 2016 නොවැම්බර් 01 දින අමාත්‍ය මණ්ඩලය විසින් ලබාදුන් තීරණය අනුව කටයුතු කළ යුතුය.

18. ක්‍රියාත්මක වන දිනය 2014.01.03 (අංක අමප/16/2494/711/028-I හා 2016.11.29 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව)

සකස් කළේ : අත්සන : ...................... ඩබ්. එම්. ඒ. ඒ. විජේරත්න සහකාර අධ්‍යක්ෂ ... සමෘද්ධි ... 2019/08/31

පරීක්ෂා කළේ : අත්සන : ......................
(විෂය භාර මාණ්ඩලික නිලධාරියා)
2019/08/31
ජී.එච්.එල්.ඩී. ගාමිණී විජේසිංහ (ශ්‍රී ලං.ප.සේ.)
අධ්‍යක්ෂ (පාලන හා ආයතන)
සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
04 වන මහල, අදියර I, "සෙත්සිරිපාය"
බත්තරමුල්ල.

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ......................
(දෙපාර්තමේන්තු ප්‍රධාන)
නම : ...................... එස්. ජී. ආර්. ටී. එම්. එස්. පී. බණ්ඩාර
තනතුර : ...................... අධ්‍යක්ෂ ජනරාල්
නිල මුද්‍රාව: ...................... සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව 04 වන මහල, අදියර 1 "සෙත්සිරිපාය" බත්තරමුල්ල.
දිනය: ...................... 2019.09.17

.......................................................................................................................................

යොමු අංකය : MSE/ADm/15/70/VII

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2019/07/18 දින අනුමත කරන ලද සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර අධි පන්තියේ (MN-07 ) පරිපාලන නිලධාරි තනතුර සඳහා වන උසස්කිරීම් පරිපාටිය සහතික කිරීම සඳහා නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ......................
නම : ......................
ලේකම්,
ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය

දිනය : 2019.10.10

නිල මුද්‍රාව : ...................... අශෝකා අලවත්ත ලේකම් ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය 01 වන මහල, සෙත්සිරිපාය -II අදියර බත්තරමුල්ල

~~යොමු අංකය~~ ......................................................

~~රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින්~~ ...................................... ~~දින අනුමත කරන ලද සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවෙහි කළමනාකරණ සහකාර අධි පන්තියේ (MN-07) පරිපාලන නිලධාරි තනතුර සඳහා වන උසස්කිරීමේ පරිපාටිය~~ ............................ ~~දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.~~

~~අත්සන :~~ ..............................

~~නම :~~ ..............................

~~ලේකම්,~~
~~රාජ්‍ය සේවා කොමිෂන් සභාව.~~

~~දිනය :~~ ........................

~~නිල මුද්‍රාව :~~ ..........................

යොමු අංකය : PSC/EST/03-01-38/08/2018

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවෙහි කළමනාකරණ සහකාර අධිපන්තියේ (MN-07) පරිපාලන නිලධාරී තනතුර සඳහා වන උසස් කිරීමේ පටිපාටිය 2019. 07. 18 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අත්සන : ..................................................

නම : ඒම්. ඒ. බී. දයා සෙනරත්

ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය : 2019. 11. 14

නිල මුද්‍රාව : එම්. ඒ. බී. දයා සෙනරත්
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
නො. 1200/9. රජමල්වත්ත පාර
බත්තරමුල්ල.